ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මීය ශිලාලේඛන මූලාශ්‍රය මගින් හෙළිවන භික්ෂු සමාජය

ඩබ්.ජී.එස්. මන්තිසි [1]

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමේ දී සාහිත්‍ය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ද වැදගත් වේ. එකී පුරාවිද්‍යා මූලාශ්‍රය අතර අභිලේඛන මූලාශ්‍රයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. අභිලේඛන ක්ෂේත්‍රයේ මූල බ්‍රාහ්මිය යුගය වසයෙන් හඳුන්වනුයේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය යි. මෙම අවධියට අයත් ශිලා ලේඛන මගින් හෙළිවන සමකාලීන ආගමික තොරතුරු රැසකි. එම තොරතුරු ආශ්‍රයෙන් හෙළිවන භික්ෂු සමාජයේ තත්ත්වයන් හා ශාසනයේ උන්නතියට භික්ෂූන් ලබා දුන් දායකත්වය පිළිබඳ විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ය. මෙහි ගැටළුව වන්නේ අතීතයේ භික්ෂූන් විසින් දැරූ තනතුරු, තත්ත්වයන් හා ඔවුන් භික්ෂු ශාසනයේ උන්නතියට ලබා දුන් දායකත්වය භික්ෂු ශාසනයේ චිර පැවැත්මට මහෝපකාරී වූයේද යන්න ය. Inscription of Ceylon ප්‍රථම කාණ්ඩය හා Epigraphia Zeylanica ග්‍රන්ථවල එන ශිලා ලේඛන ප්‍රධාන මූලාශ්‍රය ලෙස මෙහි දී ගනු ලැබේ. පූර්ව බ්‍රාහ්මීය ශිලාලේඛන තුළ භික්ෂුව හැඳින්වීම උදෙසා බිකුතෙර, අශ, සමණ, බත යනාදී විවිධ නම් භාවිත කර ඇති බව පෙනී යයි. පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛන තුළින් ගම්‍යමාන වන භික්ෂුවකගේ තත්ත්වය, ශාසනික තත්ත්වය හා නිපුණතා තත්ත්වයන් යටතේ ප්‍රධාන වශයෙන් ආකාර දෙකක් ඔස්සේ හඳුනාගත හැකි ය. ශාසනික තත්ත්වය නියෝජනය වන පද කිහිපයක් ඉහත මූල බ්‍රාහ්මීය ශිලා ලේඛන තුළ හඳුනාගත හැකි ය. එනම්, තෙර, බත, සද්ධිවිහාරික හා අන්තේවාසික වසයෙනි. සංඝයාගේ තවත් සාමාජිකයකු පුහුණු කිරීමේ වගකීම බාර ගැනීම සඳහා භික්ෂුවක් උපසම්පදා වී දස අවුරුදු ඇවෑමෙන් තෙර යන ශාසනික තත්ත්වයට පත් වේ. මෙවැනි ශාසනික තත්ත්වයක් ඇතුළත් ශිලා ලිපි කඳුරුවැව, රජගල යන ස්ථාන වලින් හඳුනාගත හැකි වේ. එසේම පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛන තුළ බහුල වශයෙන් යෙදී ඇති භික්ෂූන්ගේ ශාසනික තත්ත්වය හඟවන තවත් පදයකි; බත එනම් පාලි භාෂාවේ භන්තේ යන්නට වඩා සමීප "ස්වාමී" යන්න හැඟවෙන පදයකි. තව ද තෙර හෝ බත යන ස්ථවිරයන් සමීපයෙහි පැවිදිව වත්පිළිවෙත් මනා ලෙස පුගුණ කළ සාමණේර හෝ උපසපන් භික්ෂූන් සද්ධිවිහාරික හා අන්තේවාසික යනුවෙන් දක්වා ඇත. සමස්තයක් වසයෙන් බත සද්ධිවිහාරික අන්තේවාසිකයන් පිළිබඳව මිහින්තලය ගොනාගල යන ස්ථාන කිහිපයකින් ම තොරතුරු වාර්තා වේ. එසේ ම මෙකල භික්ෂුවගේ නිපුණතා තත්ත්වය ද ඉහත ශිලා ලිපි තුළින් හෙළි වේ. එක් එක් ආගමික ක්ෂේත්‍රයන් හි නිපුණ වූ භික්ෂූන් ඒ ඒ විෂයයන් හි ප්‍රමුඛයෝ විය. ශිලා ලේඛන තුළ භික්ෂූන්ගේ නමට ඉදිරියෙන් ආගමික විරුදාවලි දක්නට ලැබීමෙන් එය තවදුරටත් පැහැදිලි වේ. මේ අනුව ආචාර්ය, මජ්ඣිම භාණක, සංයුක්ත භාණක, විනයධර යනාදී විරුදාවලී ඔවුන්ගේ නිපුණත්ව මට්ටම් අනුව ලැබී ඇත. බුදුන් දෙසූ ධර්මය මුඛ පරම්පරාවෙන් රැගෙන ආවෝ බාණකවරු විය. මෙවැනි මජ්ඣිම නිකායෙන් ධර්මය දේශනා කළ තිස්ස නම් තෙරුන් කෙනෙකු පිළිබඳ ව දඹුලු ලිපියක සඳහන් වේ. ඒ හැරුණු විට සංයුක්ත භාණකවරයකු පිළිබඳ ව ගෝනගලින් ද තොරතුරු හමු වේ. කෙසේ වෙතත් භික්ෂූන්ගේ තනතුරු තත්ත්වයන් මගින් මෙන් ම ශාසනයේ උන්නතියට භික්ෂූන් ලබා දුන් දායකත්වය ඔස්සේ ද භික්ෂු ශාසනයේ චිර පැවැත්ම තහවුරු වූ ආකාරය හඳුනාගත හැකි ය. මේ අනුව මෙකල භික්ෂූන් ලෙන්, ස්ථූප යනාදිය තනිව ම හෝ සමූහයාගේ දායකත්වය ඇතුව සිදු කළ බවට පවතින හොඳම නිදසුන රජගල ආරාම සංකීර්ණයෙන් හමුවූ සෙල්ලිපි සාධක ය. ඒ තුළ ලෙන් විස්සක් ම භික්ෂූන්ගේ මැදිහත්වීම මත ඉදි විය. මීට අමතර ව මහාඇලගමුව, රිටිගල, කොටාදැමූහෙළ යන සෙල්ලිපි ඔස්සේ ද ඉදිකළ එවැනි මනාපදර්ශන, අඩ්ඩචන්ද නම් ලෙන් කිහිපයක් ද හඳුනාගත හැකි ය. ඉහත ආකාරයෙන් භික්ෂූන්ගේ තත්ත්වය හා ඔවුන් විසින් ශාසනයේ උන්නතියට සිදු කළ මෙහෙවර නිසාවෙන් භික්ෂු ශාසනයේ චිර පැවැත්ම තහවුරු වූ බව පෙනේ.

ප්‍රමුඛ පද: බ්‍රාහ්මීය, අභිලේඛන, භික්ෂුව, සදිවිහරිය, අන්තේවාසික

---

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. sakithmagamage10.07@gmail.com